**සීතාවක ප්‍රාදේශීය සභාව - 2021**
**-------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**
**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**
----------------------------

සීතාවක ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
----------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ වාර්තාවේ 1.2 ජේදයේ 1.2.2(අ),1.2.2(උ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගන්නා ලද රු.14,519,686ක් වූ දේපළ, පිරියත හා උපකරණ දෙවරක් සටහන් කිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ ශේෂය රු.14,519,686 කින් වැඩියෙන් දක්වා තිබුණි . | මේ සඳහා අදාල නිවැරදි කිරීම් 2022 ගිණුමෙන් සිදු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) සභාව සතු සුදුවැල්ල, ගලගෙදර යන ආදාහනාගාර 02 හි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | වටිනාකම් නිවැරදිව තක්සේරු කර 2022 වර්ෂයේ ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අදාල ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉදිකරමින් පවතින සුදුවැල්ල ආදාහනාගාරය සඳහා ගෙවූ රු.7,350,366 කෙරීගෙන යන වැඩ වෙනුවට ගොඩනැගිලි ගිණුමට සටහන් කර තිබුණි. | අදාල නිවැරදි කිරීම 2022 ගිණුමෙන් කරන බව දන්වා සිටිමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල බිල් කළ වරිපනම් බදු ආදායම රු.21,913,790 ගිණුම්ගත කරනවා වෙනුවට මූල්‍ය ප්‍රකාශනයේ රු.20,604,900 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අයභාර රු.1,308,890 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි තවද සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟහිටි වරිපනම් වටිනාකම රු.17,193,770 ක් ගිණුම්ගත කරනවා වෙනුවට වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ රු.15,884,880 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු වරිපනම් රු.1,308,890 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | ගිණුම්ගත කිරීමේ දී සිදු වී ඇති දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වරිපනම් බදු හා හිඟ වරිපනම් බදු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයේ කලින් ලද වරිපනම් ආදායම් රු.1,886,553 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයේ රු.1,706,019 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් කලින් ලද වරිපනම් ආදායම රු.180,534 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයේ කලින් ලද වරිපනම් ආදායම් ගැලපීම 2022 වර්ෂයේදී සිදු කරන බව දන්වා සිටිමි | වරිපනම් ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ බිල් කළ කඩකුලී ආදායම රු.6,926,376 ක් ගිණුම්ගත කරනවා වෙනුවට රු.6,457,984 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් හුවමාරු ගනුදෙනුවලින් වන අයභාරය රු.468,392 ක් වැඩියෙන් දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟහිටි කඩකුලී ආදායම රු.909,507ක් ගිණුම්ගත කරනවා වෙනුවට රු.440,893 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු කඩකුලීය ද රු.468,614 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ බිල් කළ කඩකුලී ආදායම නිවැරදි කරන බව දන්වා සිටිමි. | කඩකුලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ පොදු සැපයුම් ණයහිමි සඳහා වෙන් කිරීම රු.113,182,553 ක් වුවද පොදු සැපයුම් ණයහිමි ගිණුමට රු.123,599,243 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වගකීම් රු.10,416,690 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදාල ගිණුම 2022 අවසාන ගිණුමෙන් නිවැරදි කරන බව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඌ) | රු.374,840 ක් වූ සේවක ඇප ගිණුමේ ශේෂය හා සේවක ඇප අයෝජන ගිණුමේ ශේෂය ජංගම වත්කමක් හා ජංගම වගකීමක් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | 2021 දෙසැම්බර් 31 දිනට සභාවේ අතැති මුදල් හා බැංකු ගිණුම්වල ශේෂය රු.48,786,510 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එය රු.115,734,394 ක අයිරා ශේෂයක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දැක්වෙන අතැති මුදල් ශේෂය අතර රු.164,520,904 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ සමඟ අමුණා එවන බව දන්වා සිටිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුවේ. |
| (ඒ) | 2021 දෙසැම්බර් 31 දිනට විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව සමුච්චිත අතිරික්තය රු.352,853,717 ක් වුවද, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය අනුව එය රු.500,631,911 ක් වූයෙන් රු.147,778,193 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂයන් අතර රු.147,778,193 ක වෙනස 2022 වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | ස්කන්ධ වෙනස්වීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඔ) | සවිකිරීම් ශේෂය රු.383,148 ක් වෙනුවට රු.183,933ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය රු.199,215 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අගයන් දෙක අතර වෙනස වන රු .199,215ක වටිනාකම 2022 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදි අගයන් නිවැරදි ගිණුම් තුළ ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඕ) | 2020 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්වලින් ලද වත්කම් සඳහා වූ ක්‍රමක්ෂය රු.9,483,378 ක් වුවත් එය රු.50,303,341 ක් ලෙස ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ අයභාරය රු.40,819,963 කින් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | එය 2022 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ක්‍රමක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ |
| (ක) | සමාලෝචිත වර්ෂයේ රු.5,672,904 ක් වටිනා ශේෂයක් ප්‍රාග්ධන වත්කම් ගිණුමෙහි අංක 4-1312-2 වැඩසටහන යටතේ වෙනත් ලෙස බැර කර තිබුණද, එම වටිනාකමට අදාල හර සටහනක් යොදා ඇති බවට සාක්ෂි ඉදිරිපත් නොවිය. | 2022 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි . | නිවැරදි හර බැර සටහන් ගිණුම්වල අනාවරණය කළ යුතුවේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 ජනවාරි 01 දිනට ගිණුම් විෂයයන් 02 ක ආරම්භක ශේෂය, ජනල් සටහන අනුව රු.702,098,041 වුවත් ලෙජර් ගිණුමට එය රු.689,903,641ක් වීම හේතුවෙන් රු.12,194,400ක වෙනස්කමක් නිරීක්ෂණය විය. | නිවැරදි වටිනාකම් ගිණුම තුල නිවැරදිව ගලපා ඇති බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) සමාලෝචිත වර්ෂ අවසානයේ ගිණුම් විෂයයන් 03 ක මුල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.279,460,980ක් වුවත් උපලේඛන අනුව ශේෂය රු.251,349,009 ක් වී තිබුණි. | අදාල ගැලපුම නිවැරදි කර 2022 වර්ෂය් අවසාන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | -එම- |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 127 හා 128 වගන්ති සහ සුසාන භූමි හා මිනි පිටි ආඥා පනතේ 3 වගන්තිය | සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති සුසාන භූමිවලින් සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සුසාන භූමි 26 ක් ද පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සුසාන භූමි 27 ක් ද සභාවට පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | කොට්ඨාශයට අයත් සුසාන භූමි පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකර ඇති බව දන්වා සිටිමි. | අදාළ පනත් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) 153 වගන්තිය | ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් කැබලි 13 ක් සම්බන්ධයෙන් රු.9,114,600ක් බදු පැන විය යුතු වුවත් එසේ බදු පනවා නොතිබුණි. | සංවර්ධනය නොකළ ඉඩම් 13ක් බව ප්‍රකාශකර සිටිමි. | ප්‍රාදේශීය සභා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2021 දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පතු ශේෂය තුළ වර්ෂ 03 කට වඩා පැරණි රු.12,428,604 ක ශේෂයක් පැවති අතර මෙම ශේෂය නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසර 03 කට වැඩි මුදලින් ආදායමට ගත හැකි වටිනාකම් ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර ඉදිරියේ දී ආදායමට ගැනීම සිදු කරන බව දන්වා සිටිමි. | ආදායමට ගතයුතු ශේෂය නිවැරදිව හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. |

2. **මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 147,778,193 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 30,356,058 ක් විය.

2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පෙර වර්ෂයේ රැස්කළ ආදායම රු.මි.363.9 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු.මි.272.2 ක් දක්වා රු.මි.91.7 කින් අඩු වී තිබුණි. | කොරෝනා වයිරස ව්‍යාප්තිය හේතුවෙන් නිවසින් නිවසට ගොස් මුදල් එකතු කිරීමේ කටයුතු සිදු නොකළ අතර දේපළ තහනම් කිරීමේ කටයුතුද සිදු නොකල බැවින් ආදායම් රැස් කිරීම අඩු වී ඇති බව දන්වා සිටිමි. | සභාවේ ආදායම් උපරිම කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

2.3 **හිඟ ආදායම්**

-------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) **අක්කර බදු**<br>-------------<br>සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ අක්කර බදු ශේෂය රු.82,135 ක් වූ අතර ඉන් රු.39,946ක් වසර 10 කට වඩා පැරණි එවා වන අතර එම හිඟය අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | පාදුක්ක උප කාර්යාලයේ 2021.12.31 දක්වා හිඟ අක්කර බදු මුදල රු.67,066.45 කි. ඉන් රු.39,945.95 ක් වන වසර 10 කට වඩා වැඩි හිඟ මුදල අය කර ගැනීම සඳහා 2022.01.26 වන දින ලිපි මගින් අදාල හිමිකරු වෙත දැනුවත් කර ඇත. මුදල් අය කර ගැනීම සඳහා ඉදිරියටත් කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ |

| | | |
|---|---|---|
| (ආ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>------------------------------<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.65,000,000 ක් හා මුද්දර ගාස්තු රු.238,818,875 ක් විය. මේ තුළ 2021 වර්ෂයේදී ඇස්තමේන්තු කළ උසාවි දඩ රු.30,000,000 ක් හා මුද්දර ගාස්තු රු.135,000,000 ක් විය. | 2019 වර්ෂය පළමු මාස 06 වෙනුවෙන් මුදල් ලබා ගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව දන්වා සිටි. 2019 වර්ෂයේ ඉතිරි මාස 06 ක කාලය සඳහා සකස් කරන ලද උප ලේඛන අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත පරීක්ෂා කිරීම සඳහා යොමු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br>2020 වර්ෂය සඳහා අදාල වන උසාවි දඩ උප ලේඛන මේ වන විට සකස් කරමින් පවතී. 2021 වර්ෂය සඳහා අදාල වන උප ලේඛන ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරනු ලබනු බව දන්වා සිටිමි. | මුද්දර ගාස්තු හා උසාවි දඩ ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. |
| (ඇ) **ලැබිය යුතු පළාත් සභා විමධ්‍යගත ආධාර**<br>---------------------------------------------<br>සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු පළාත් සභා හා විමධ්‍යගත ආධාර රු.63,445,911 ක් ලබා ගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පළාත් සභා සහ විමධ්‍යගත ආධාර රු.63,445,911 ක වටිනාකමින් රු.24,004,050/- ක් 2022.08.15 දින වනවිට අයකරගෙන ඇත. | ලැබිය යුතු පළාත් සභා විමධ්‍යගත ආධාර ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3 මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

**3.1 මානව සම්පත් කළමනාකරණය**
-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 220 ක් වූ අතර ප්‍රාථමික හා ද්විතික ශ්‍රේණිවල පුරප්පාඩු 34 ක් පැවතුණි. | පුස්තකාලයාධිපති හා කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සම්පූර්ණ කරනු ලබයි.<br>ආදායම් පරීක්ෂකවරුන් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවතින බැවින් ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ලැබෙන තුරු ඒ සම්බන්ධයෙන් කටයුතු කළ නොහැකි බව දන්වා | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | සිටිමි.<br>සෞඛ්‍ය පරිපාලක හා පෙරපාසල් තනතුරු සඳහා(සීමිත) බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් සකස් කර ඇති අතර අනුමැතිය ලබා ගැනීමෙන් පසු පුරප්පාඩු පුරවන බව දන්වා සිටිමි. | |

**3.2 සේවක ණය**

--------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිය ගිය, විශ්‍රාම ගිය සහ සේවය අතහැර ගිය නිලධාරීන් හා සේවයේ නියුතු සේවකයන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය ශේෂය රු.864,226 ක් වී තිබුණි. | ස්ථාන මාරු වී ගිය ,මිය ගිය ,විශ්‍රාම ගිය සහ සේවය අතහැර ගිය නිලධාරීන් හා සේවකයන් 15දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය ශේෂය රු.2,336,373 ක් වේ. | ලැබිය යුතු සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2021 නොවැම්බර් 10 දිනැති චක්‍රලේඛ LGD/02/2021 ට අනුව 2021 මුදල් වර්ෂය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට සියළු ගිණුම් පියවා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඊට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටලය 2022 පෙබරවාරි 28 දිනට පෙර පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන සහකාර කොමසාරිස්ටද පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සීතාවක ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2022 ජුනි 03 දිනදීය. | පිළිතුරු ලබා දී නොමැත | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ යුතුවේ. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මට අනුව කර්තව්‍යයන් 8ක් ඉටුකිරීම සඳහා වාර්ෂික අයවැය මඟින් රු.15,123,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම කර්තව්‍යයන් ඉටුකර නොතිබුණි. | කොවිඩ් වසංගත ව්‍යාප්තිය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වා සිටිමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් ක්‍රියාත්මක කළ යුතුවේ. |

**4.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගබඩා තොග සමීක්ෂණ වාර්තාවට අනුව වෙන්දේසි කිරීමට නිර්දේශිත භාණ්ඩ ඒකක 3144 ක් හා ඉවත් කිරීමට නිර්දේශිත භාණ්ඩ ඒකක 32 ක් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2022 මාර්තු 4 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගබඩා තොග සමීක්ෂණ වාර්තාවට අනුව වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ 3144ක් වෙන්දේසි කිරීම සඳහා 2022.03.10 දින මහා සභාවේ (ඊ) – 01 දරණ සභා තීරණය අනුව වෙන්දේසි මණ්ඩලයක් පත්කර ඇත.<br>නිවැරදි අපහරණ භාණ්ඩ ලේඛනය වනුයේ භාණ්ඩ 16 ක් වන අතර අනුව අපහරණ මණ්ඩලයක් පත්කර ඇත. 2022 ජූනි මාසය තුළ අපහරණ කටයුතු සිදු කර අවසන් කරන බව අපහරණ මණ්ඩලයේ සාමාජිකයින් විසින් ප්‍රකාශ කරන ලදි. | අපහරණ කටයුතු කඩිනමින් සිදුකළ යුතුවේ. |